# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1724/14 - 2011 සැප්තැම්බර් 23 වැනි සිකුරාදා - 2011.09.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1988 අංක 43 දරන පනතින් සංශෝධිත 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත යටතේ සාදනු ලබන රීති**

මීට පූර්වෝක්තව ම විසින් 2001.04.20 දිනැතිව *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය* මගින් පනවනු ලැබ ඇති, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා සේවකයින් විශ්‍රාම ගැන්වීමේ වයස දැක්වෙන රීතිය මේ මගින් සංශෝධනය වන බව දන්වමි.

1988 අංක 43 දරන පනතින් සංශෝධිත 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ 12 වැනි වගන්තිය යටතේ සංස්ථාව වෙත පැවරී ඇති බලතල අනුව යථෝක්ත පනතේ 27(1) වගන්තිය හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 60 අනුව පහත සඳහන් රීතිය සම්පාදනය කරනු ලැබ ඇත.

"වයස අවුරුදු 57 සම්පූර්ණ කරනු ලබන සියලුම සංස්ථා සේවකයින් විශ්‍රාම ගන්වනු ලබන බව සැලකිය යුතු අතර වයස අවුරුදු 57න් ඔබ්බට සේවා දීර්ඝ කිරීමක් සිදුකරනු නොලැබේ."

යථෝක්ත පනතේ 27(2) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව එම රීතිය අනුමත කරන ලද බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල,
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍ය.

2011 සැප්තැම්බර් මස 01 වැනි දින,
කොළඹ 05, කිරුළපන මාවතේ, පොල්හේන්ගොඩ,
අංක 163, ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ දී ය.

10-137

1A - G 15100 — 340 (2011/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.